**කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**
**පුරප්පාඩු**

කැලණිය විශ්වවිද්‍යාලයේ පරිගණක හා තාක්ෂණ පීඨයේ පුරප්පාඩුව පවත්නා පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. **තාක්ෂණික නිලධාරි (ICT) III ශ්‍රේණිය**

   **සුදුසුකම් :**

   I. අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී ඕනෑම විෂය ධාරාවකින් විෂයන් තුනක් (03) එකවර සමත් වීම.

   **සහ**

   II. තොරතුරු සන්නිවේදනය සහ බහු මාධ්‍ය තාක්ෂණය / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය / තොරතුරු තාක්ෂණය හෝ සමාන ක්ෂේත්‍රයක තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණ / වෘත්තීය අභ්‍යාස ආයතනයකින් හෝ පිළිගත් ආයතනයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය කුසලතා N.V.Q. 5 මට්ටම හෝ නොඅඩු මට්ටමක නිපුණතා සහතිකයක් ලබා තිබීම.

- **ICT (තොරතුරු සන්නිවේදන තාක්ෂණ) ක්ෂේත්‍රයේ සේවා පළපුරුද්ද සහිත අයහට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ)**

**වයස් සීමාව :** අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුයි.

**වැටුප් ක්‍රමය :** UMT 1 (III A) - රු. 31,625 – 7 x 300 ; 10 x 355 – 37,275 (මාසික වැටුප් පරිමාණය මෙම තනතුරට අදාළ වේ.)

(මෙම වැටුප් කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 අනුව වැටුප් පරිමාණය වේ. මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

**බඳවා ගනු ලබන ආකාරය :** ලිඛිත සහ / හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

## 2. තාක්ෂණික නිලධාරි (II ශ්‍රේණිය) “ ආ” ඛණ්ඩය

**සුදුසුකම් :**

1. අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී විද්‍යා විෂය ධාරාවෙන් විෂයන් තුනක් (03) එකවර සමත් වීම. අදාළ විෂය සංයෝජන පහත පරිදි විය යුතුය.

    - රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය
    - රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ ජීව විද්‍යාව

**සහ**

**තනතුරට අදාළව එක් අවුරුදු පූර්ණකාලීන පාඨමාලාවක් හදාරා තිබීම. අදාළ සහතිකවල පිළිගැනීම / නොපිළිගැනීම අදාළ පීඨය විසින් තිරණය කරනු ඇත.**

**වයස් සීමාව :** අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 35 ට නොවැඩි විය යුතුයි.

- **සටහන** : බඳවාගනු ලබන තැනැත්තන් ප්‍රථමයෙන් වසර තුනක (03) පුහුණුවීමේ කාල සීමාවකට යටත්ව රු. 31,625 /- ක ස්ථාවර මාසික දීමනාවක් මත පුහුණුවන තාක්ෂණ නිලධාරින් වශයෙන් පත්කරනු ලැබේ. පුහුණුවීමේ කාලය අවසන් වීමෙන් පසු විද්‍යාගාර කටයුතු පිළිබඳ නිපුණත්වය, භාණ්ඩ ඇණවුම් කිරීම, තොග පොත් පවත්වාගෙන යාම සහ ඉංග්‍රීසි භාෂාවෙන් යතුරු ලිවීම පිළිබඳ ප්‍රවීනත්වයක් ලබා ගත් සේවක හවතුන් තනතුරේ තහවුරු කර තාක්ෂණික නිලධාරි (II ශ්‍රේණිය) – “ආ” ඛණ්ඩය ’ තනතුරට පත් කරනු ලැබේ.

**වැටුප් ක්‍රමය :** UMT 1 (III A) - රු. 31,625 – 7 x 300 ; 10 x 355 – 37,275 (මාසික වැටුප් පරිමාණය මෙම තනතුරට අදාළ වේ.)

(මෙම වැටුප් කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 අනුව වැටුප් පරිමාණය වේ. මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

**බඳවා ගනු ලබන ආකාරය :** ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

## 3. කළමනාකරණ සහකාර (III ශ්‍රේණිය)

**සුදුසුකම් :**

**1.** අ.පො.ස (සා.පෙළ) විභාගයේ

- සිංහල භාෂාව / දෙමළ භාෂාව
- ඉංග්‍රීසි භාෂාව / ඉංග්‍රීසි සාහිත්‍ය
- ගණිතය

යන විෂයන්ට සම්මාන සමාර්ථ සහිතව විෂයන් හයක් (06) එකවරක දී සමත්ව තිබීම.

**සහ**

**2.** අ.පො.ස (උ.පෙළ) විභාගය එක් වරක දී සියලු විෂයන් සමත්වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර)
(පැරණි විෂය නිර්දේශය යටතේ එකවර විෂයන් තුනක් (03) සමත්වීම ප්‍රමාණවත් වේ.)

**3. පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අය කෙරෙහි ප්‍රමුඛතාවක් දක්වනු ලැබේ.**

(අ) පිළිගත් ආයතනයකින් ලබාගත් මාස හයකට (06) නොඅඩු පරිගණක යෙදුම් භාවිතය පිළිබඳ සුදුසුකම් ලබා තිබීම.

(ආ) පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිළිබඳ වසර 02 පළපුරුද්දක් ලබා තිබීම.

**සටහන :**

(අ) ශ්‍රී ලංකා පුරවැසියෙක් විය යුතුය.

(ආ) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවුරුදු 18 ට නොඅඩු වියයුතු අතර අවුරුදු 30 නොවැඩි වියයුතුය.

(ඇ) මනා චරිතයකින් යුක්ත විය යුතුය.

**වැටුප් ක්‍රමය :** U-MN 1 (III A ) - රු. 30,725 - 17 x 300 - 35,825 (මාසික වැටුප් පරිමාණය මෙම තනතුරට අදාළ වේ.)

(මෙම වැටුප් කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 අනුව වැටුප් පරිමාණය වේ. මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

**බඳවා ගනු ලබන ආකාරය :** පහත විෂයන් සම්බන්ධ ලිඛිත පරීක්ෂණයකින් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

- සිංහල / දෙමළ සහ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ දැනුම
- සාමාන්‍ය දැනුම සහ බුද්ධි පරීක්ෂණය
- පරිගණක සාක්ෂරතාවය

## 4. යාන්ත්‍රික ශිල්පී (II ශ්‍රේණිය)

**සුදුසුකම් :**

I. 07 වන ශ්‍රේණිය සමත් විය යුතුය.

II. පහත සඳහන් කරුණු පිළිබඳ නිපුණත්වය -

(අ) අඟලෙන් 1/64 දක්වා පරිමාණයන් කියවීම හා මයික්‍රොමීටර සැකසීම.

(ආ) ශිල්පයට අදාළ සියලු මෙවලම් සහ ඇමුණුම් නම් කිරීම, භාවිතය සහ නඩත්තු කිරීම.

(ඇ) කාර්යයට අදාළ සියලුම ඇඳීම් කියවීම හා තේරුම් ගැනීම.

(ඇ) යන්ත්‍ර දක්ෂ ලෙස ක්‍රියාත්මක කිරීමේ හැකියාව. ( උදාහරණ : විදින යන්ත්‍රය, හැඩ ගැසීමේ යන්ත්‍ර, ග්‍රයින්ඩර් යන්ත්‍ර හා ලේත් යන්ත්‍ර)

III. පිළිගත් ආයතනයක යාන්ත්‍රික ශිල්පී කටයුතු සම්බන්ධයෙන් වසර 02 කට නොඅඩු පළපුරුද්දක් තිබීම.

- **සේවා පළපුරුද්දට අදාළ සේවා සහතික වල පිටපතක් අයදුම්පතට අමුණා එවිය යුතුය. එසේ නොමැති අයදුම්පත් අදාළ සේවා පළපුරුද්ද නොමැති සේ සලකා ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**වැටුප් ක්‍රමය :** U-PL 3 (III ) - රු. 29,915 - 16 x 270 - 34,235 (මාසික වැටුප් පරිමාණය මෙම තනතුරට අදාළ වේ.)

(මෙම වැටුප් කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 අනුව වැටුප් පරිමාණය වේ. මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

**බඳවා ගනු ලබන ආකාරය :** වෘත්තීය පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

**වයස් සීමාව :** අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 40 ට නොවැඩි විය යුතුයි.

## 5. වැද්දුම්කරු (II ශ්‍රේණිය)

**සුදුසුකම් :**

I. කියවීමේ හා ලිවීමේ හැකියාව තිබිය යුතුය.

II. මිණුම් උපකරණවල අඟලෙන් 1/64 පරිමාණයන් කියවීමේ හැකියාව සහ භාග සංඛ්‍යා මිනුම් අනුපාත සටහන් කරගැනීමේ හැකියාව, ඉංජිනේරුමය ඇඳීම් කියවීමේ සහ තේරුම් ගැනීමේ හැකියාව, වාෂ්ප, මොටර් සහ ඩීසල් බලයෙන් ක්‍රියාකරන යන්ත්‍ර සහ ගවර්නර් ආදියෙහි නොයෙකුත් අන්දමේ වැද්දුම් සකස් කිරීමේ සහ සූක්ෂම මානක කියවීම පිළිබඳ දැනුමක් තිබිය යුතුය.

III. රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ ඉංජිනේරු ආයතනයක වැද්දුම්කරුවෙකු වශයෙන් වසර 02 කට නොඅඩු පළපුරුද්දක් තිබීම.

**වැටුප් ක්‍රමය :** U-PL 3 (III ) - රු. 29,915 - 16 x 270 - 34,235 (මාසික වැටුප් පරිමාණය මෙම තනතුරට අදාළ වේ.)

(මෙම වැටුප් කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 අනුව වැටුප් පරිමාණය වේ. මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

**බඳවා ගනු ලබන ආකාරය :** වෘත්තීය පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

**වයස් සීමාව :** අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 40 ට නොවැඩි විය යුතුයි.

**6. පෑස්සුම්කරු (II ශ්‍රේණිය)**

**සුදුසුකම් :**

I. කියවීමේ හා ලිවීමේ හැකියාව තිබිය යුතුය.

II. පහත දැක්වෙන ක්‍රියාකාරකම් ගැන මනා දැනීමක් තිබීම.

(අ) පරිමාණ කියවීමේ හැකියාව, අඟලෙන් 1/32 වන තෙක් සරළ යාන්ත්‍රික ඉංජිනේරු ඇඳීමක් කියවීමට සහ තේරුම් ගැනීමට ඇති හැකියාව, හෙත්තු අත්වැසුම්, පරිවුම්, මුලු ද සහ අනෙකුත් වෙල්ඩින් සඳහා සූදානම් වීම සහ කිරීමේ හැකියාව.

(ආ) මව හරස්කඩ සහ ලෝහ වර්ග සඳහා භාවිතා කරන ඉලෙක්ට්‍රෝඩ සහ ඒවායේ විවිධ ප්‍රමාණ හා අවශ්‍ය වන ධාරාව ගැන දැන සිටිම. තිරස් සිරස් සහ උඩින් වෙල්ඩින් කිරීමේ හැකියාව.

(ඇ) වායු වෙල්ඩීමකදී හෝ කැබලි ක්ලිප් හොඳ නිමාවක් ලැබෙන සේ පුරවා ගැනීමේ හැකියාව. ඇසිටලීන් පිරියතයක හෝ වායු සිලින්ඩරයක සුලු වරදක් ඇති විට එය සොයාගෙන නිවැරදි කිරීමේ හැකියාව.

III. රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ ඉංජිනේරු ආයතනයක පෑස්සුම්කරුවෙකු ලෙස අවුරුදු දෙකකට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය.

**වැටුප් ක්‍රමය :** U-PL 3 (III ) - රු. 29,915 - 16 x 270 - 34,235 (මාසික වැටුප් පරිමාණය මෙම තනතුරට අදාළ වේ.)

(මෙම වැටුප් කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 අනුව වැටුප් පරිමාණය වේ.මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

**බඳවා ගනු ලබන ආකාරය :** වෘත්තීය පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

**වයස් සීමාව :** අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 40 ට නොවැඩි විය යුතුයි.

**7. විද්‍යාගාර සහායක (III ශ්‍රේණිය)**

**සුදුසුකම් :**

I. දෙවරකට නොඅඩු වාර ගණනකදී අවම සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව අ.පො.ස. සා/පෙළ විභාගයේ විෂයයන් හයකින් (06) සමත්ව තිබීම.

**සහ**

II. පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද පනතක් ප්‍රකාරව ස්ථාපිත කරන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයක් හෝ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිසම විසින් පිළිගත් කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් මගින් නිකුත් කරන ලද ප්‍රමිතිගත විද්‍යාගාර උපකරණ සහ විද්‍යාගාර උපකරණ ශිල්ප ක්‍රමවලට අදාල ක්ෂේත්‍රයක ජාතික වෘත්තීය සුදුසුකමෙහි 2 හෝ 3 මට්ටම (NVQ Level 2 or 3) ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**සටහන :** ප්‍රමිතිගත විද්‍යාගාර උපකරණ, සැපයුම් පිළිබඳ දැනුම හා භාවිතය සහිත සමාන පරිමාණයෙහි මාස හයක අවම සේවා පළපුරුද්ද සහ විද්‍යාගාර සහායක තනතුරට උචිත වැඩසටහන් සැලසුම් කෙරෙන තෙක් ජාතික වෘත්තීය සුදුසුකම් රාමුවේ 2 හෝ 3 මට්ටමට (NVQ Level 2 or 3) අදාළ යැයි සැලකෙන නව විද්‍යාගාර ශිල්ප ක්‍රම ඉගෙනීමේ හැකියාව.

**වැටුප් ක්‍රමය :** U-PL 2 (III ) - රු. 28,025 - 16 x 270 - 32,345 (මාසික වැටුප් පරිමාණය මෙම තනතුරට අදාළ වේ.)

(මෙම වැටුප් කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 අනුව වැටුප් පරිමාණය වේ.මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

**බඳවා ගනු ලබන ආකාරය :** යෝග්‍යතා පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

**වයස් සීමාව :** අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුයි.

**8. වැඩ සහායක (III ශ්‍රේණිය)**

**සුදුසුකම් :**

I. දෙවරකට නොඅඩු වාර ගණනකදී අවම සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව අ.පො.ස. සා/පෙළ විභාගයේ විෂයයන් හයකින් (06) සමත්ව තිබීම.

**සටහන :**

(අ) ශ්‍රී ලංකා පුරවැසියෙක් විය යුතුය.

(ආ) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවුරුදු 18 ට නොඅඩු වියයුතු අතර අවුරුදු 45 නොවැඩි විය යුතුය.

(ඇ) මනා චරිතයකින් සහ සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

**වැටුප් ක්‍රමය :** U-PL 1 (III ) - රු. 27,025 - 16 x 250 - 30,775 (මාසික වැටුප් පරිමාණය මෙම තනතුරට අදාළ වේ.)

(මෙම වැටුප් කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 අනුව වැටුප් පරිමාණය වේ.මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

**බඳවා ගනු ලබන ආකාරය :** ලිඛිත පරීක්ෂණයක් සහ / හෝ සම්මුඛ පරීක්ෂණයක් මගින්

## අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය

වැඩි විස්තර සහිත දැන්වීම සහ අයදුම්පත් විශ්වවිද්‍යාලයේ නිල වෙබ් අඩවියට (www.kln.ac.lk/vacancies) පිවිසීමෙන් ලබාගත හැක. නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් අදාළ සහතිකවල පිටපත් සමග ඉල්ලුම් කරනු ලබන තනතුර ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කර **2024 මැයි මස 17** දින හෝ ඊට පෙර ලැබෙන පරිදි **සහකාර ලේඛකාධිකාරි / ආයතන අනධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, දළුගම, කැලණිය** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. අයදුම් කිරීමට පෙර ඉහත සඳහන් විශ්වවිද්‍යාලයේ නිල වෙබ් අඩවියේ පළකර ඇති සම්පූර්ණ විස්තරය සහිත දැන්වීම හොඳින් කියවා බලා අයදුම් කලයුතු බව සියලු අයදුම් කරුවන් වෙත දැනුම් දෙනු ලැබේ.

උසස් අධ්‍යාපන ආයතන, රාජ්‍ය දෙපාර්තමේන්තු, සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවය කරන අයදුම්කරුවන් හට වයස් සීමාව බල නොපාන අතර ඔවුන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

අයදුම්පත් කෙටි ලැයිස්තුගත කිරීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතුය. එසේම ඉහත තනතුරු සියල්ලම හෝ ඉන් එකක් හෝ එකකට වැඩි ප්‍රමාණයන් බඳවා ගැනීමේ හෝ නොගැනීමේ තීරණය විශ්වවිද්‍යාලයේ පාලක සභාව සතුවේ. මේ සම්බන්ධ අවසාන තීරණය පාලක සභාවේ තීරණය වේ.

අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති, අසම්පූර්ණ, අපැහැදිලි හා නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර එසේ පතික්ෂේප කරනු ලැබූ අයදුම්පත් කිසිදු හේතුවක් නිසා හෝ යළි සලකා බලනු නොලැබේ.

**ලේඛකාධිකාරි**
**කැලණිය විශ්වවිද්‍යාලය**
**2024.04.29**